විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
MINISTRY OF POWER AND ENERGY

අංක:80, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07 இல: 80, சேர். ஏர்னஸ்ட் டி சில்வா மாவத்தை, கொழும்பு 07 No: 80, Sir Ernest De Silva Mw, Colombo 07

මගේ අංකය / எனது இல / My No } MOPE/SEC/COM/2022 ඔබේ අංකය / உமது இல / Your No } දිනය / திகதி / Date } 30.07.2022

# මාධ්‍ය නිවේදනය

1. ජාතික ඉන්ධන අවසර පත්‍ර (QR) ක්‍රමවේදය අගෝස්තු 1 වනදා සිට දිවයින පුරා ක්‍රියාත්මක වනු ඇත. අවසන් ඉලක්කම් මත පදනම් අංක තහඩු ක්‍රමය, ටෝකන් සහ මෙතෙක් ක්‍රියාත්මක වූ අනෙකුත් ක්‍රමවේද මින් ඉදිරියට වලංගු නොවන අතර QR කේතය සහ කෝටා ක්‍රමය ආදේශ කරනු ලැබේ.

2. QR ක්‍රමවේදයට අනුගත වූ ඉන්ධන පිරවුම්හල් සඳහා ඉන්ධන බෙදා හැරීමට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. ඉන්ධන පිරවුම්හල් වෙත බෙදා හරින ලද ඉන්ධන තොගවලින් QR කේතය භාවිතා කර ඉන්ධන නිකුත් කිරීම නිරීක්ෂණය කර එම බෙදා හැරීම ඉදිරියේදී සිදු කරනු ලැබේ.

3. චැසි අංකය සමඟ ලියාපදිංචි වීමට නොහැකි රථ වාහන භාවිත කරන්නන්ට හෙට සිට ආදායම් බලපත්‍ර අංකය සමඟ ලියාපදිංචි විය හැකිය.

4. සියලුම ත්‍රිරෝද රථ අදාළ පොලිස් ස්ථානයේ ලියාපදිංචි විය යුතු අතර ඔවුන්ට ආසන්නතම ඉන්ධන පිරවුම්හල නම් කර ලබා දිය යුතු අතර ඒ අනුව ඉදිරියේදී එම පිරවුම්හල්වලින් ඉන්ධන ලබා දීමට කටයුතු කරනු ලැබේ.

5. විදුලිජනක යන්ත්‍ර, උද්‍යාන උපකරණ, යන්ත්‍රෝපකරණ සහ ඉන්ධන අවශ්‍ය අනෙකුත් උපකරණ භාවිතා කරන්නන්ට අවශ්‍ය ඉන්ධන වර්ගය, සතිපතා ඉන්ධන අවශ්‍යතාවය සහ ඔවුන් ඉන්ධන ලබා ගැනීමට බලාපොරොතු වන පිරවුම්හල තෝරාගෙන අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලියාපදිංචි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

6. රථ වාහන කිහිපයක් ඇති ව්‍යාපාරවලට ඔවුන්ගේ ව්‍යාපාර ලියාපදිංචි අංකය සමඟ එම සියලුම රථ වාහන ලියාපදිංචි කළ හැක.

7. පොදු ප්‍රවාහනයට ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ. ඒ අනුව බස් රථ සඳහා ඉන්ධන කෝටාව ලංකා ගමනාගමන මණ්ඩලයේ (CTB) ඩිපෝවලින් ලබා දී වෙන් කරනු ලබන්නේ මාර්ග බලපත්‍රය සහ ධාවනයේ පවතින කිලෝ මීටර් ගණන අනුව තීරණය කරනු ලබන කෝටාවක් අනුවය. එම අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය එම ඩිපෝ සහ හඳුනාගත් ඉන්ධන පිරවුම්හල්වලින් නිකුත් කරනු ලැබේ.

8. බලධාරීන් විසින් අනුමත කරන ලද පාසල් සේවා වාහන, කාර්යාල ප්‍රවාහන සේවා, කර්මාන්ත, සංචාරක අංශය, ගිලන්රථ සහ අනෙකුත් අත්‍යවශ්‍ය සේවා සඳහා ඩීසල් ඉන්ධන අවශ්‍යතා සඳහා ලංකා ගමනාගමන මණ්ඩලයේ (CTB) ඩිපෝ මගින් පහසුකම් සපයනු ලැබේ.

9. සියලුම ඉන්ධන පිරවුම්හල්වල ගිලන්රථ සඳහා ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලබන අතර ඔවුන්ගේ වාහනවලට ඉන්ධන සඳහා ඔවුන් විසින් ඉල්ලා සිටින ඉන්ධන ප්‍රමාණය ලබා දෙනු ලැබේ.

10. එක් එක් පොලිස් ස්ථානය වෙනුවෙන් තෝරාගත් ඉන්ධන පිරවුම්හල්වලින් පොලිස් දෙපාර්තමේන්තුවට වෙන් කරන ලද කෝටාවක් ලබා දීමට කටයුතු කරන අතර එය ඉදිරියේදී එම පිරවුම්හල් වෙත ලබා දිය යුතු කොටවා පිළිබඳව දැනුවත් කරනු ලැබේ.

11. නීතිවිරෝධී ලෙස ඉන්ධන තොග ගබඩා කිරීම, විකුණුම් කටයුතු හෝ ඉන්ධන ලබා දීමේදී ලබා දී ඇති උපදෙස් පිළිනොපදින ඉන්ධන පිරවුම්හල් සහ පුද්ගලයන් පිළිබඳව ඡායාරූප හෝ වීඩියෝ සාක්ෂි WhatsApp හරහා 0742123123 අංකය වෙත යොමු කිරීමට මහජනතාවට අවස්ථාව ලබා දෙනු ලැබේ. නැවත නැවත වැරදි කරන්නන් සඳහා QR ප්‍රවේශය තාවකාලිකව අවහිර කිරීමට එම සාක්ෂි භාවිතා කිරීමටත් ඒ අනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් එමගින් කටයුතු කරනු ලැබේ.

12. දිවයින පුරා ඉන්ධන පිරවුම්හල්වලින් තමන්ට වෙන් කර ඇති කෝටාව ලබා ගැනීමට මුළු සතියක කාලයක් තිබෙන බැවින්, සඳුදා දිනයේම ඉන්ධන පිරවුම්හල්වලට එකතු වී තදබදයක් ඇති නොවන ලෙස කටයුතු කරන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
30.07.2022